


# යේසුස් වහන්සේ කවරෙක් ද?

පෝල් සිල්මර්

**(Who is Jesus ?)**

**කවරයේ රූපසටහන් : පෙරදිග සහ අපරදිග විවිධ චාරිත්‍ර සතු වූ විවිධ චිත්‍රශිල්පීන් යේසුස් වහන්සේ දුටු ආකාරය. නමුත් බයිබලය යේසුස්වහන්සේගේ හැඩරුව කෙසේත්ම නොපෙන්වයි.**

# යේසුස් වහන්සේ කවරෙක් ද?

## පෝල් සිල්මර් විසින්

යේසුස් වහන්සේ වසර 2000කට පමණ පෙර ඊශ්‍රායල් යයි කියන රටේ විසූ යුදෙව් ගුරුවරයෙක් විය. ඒ කාලයේ එම ප්‍රදේශය රෝමානු අධිරාජ්‍යයේ කොටසක් විය. ඔහු නොවැදගත් නගරයක වැඩ කරන පන්තියේ පවුලක හැදී වැඩුනි. ඔහු සුළු මූලික ඉගෙනුමක් ලැබූවද, ඔහුගේ ඉගැන්වීම් වචනාර්ථයෙන්ම ලෝකය වෙනස් කළේය.

ක්‍රිස්තියානි ආගම පදනම්ව ඇත්තේ අප මෙන්වූ මිනිසෙක් වූ එමෙන්ම එකම ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයා වන මේ යේසුස් වහන්සේ විශ්වාස කරගෙනය. එනිසා ඔහුගේ ඉගැන්වීම් දෙවියන් වහන්සේගෙන් ලද පණිවිඩයක් ය.

ඔහුගේ ඉගැන්වීම් පදනම වූයේ මිනිස් වර්ගයා පාපය නිසා මරණයට පත්වීමය" යේසුස් වහන්සේ කිසිදිනක පව් නොකළේය" දෙවියන් වහන්සේ ඔහු එවූයේ මිනිසා පාපයෙන් හා මරණයෙන් ගලවා ගැනීමටය. යේසුස් වහන්සේ මිය ගිය නමුත් දෙවියන් වහන්සේ විසින් ඔහුව සදාකාල ජීවනය සඳහා නැගිටවනු ලැබූහ. ක්‍රිස්තියානි බලාපොරොත්තුව වන්නේ අපද ඔහු සමඟ සදාකාල ජීවනය සඳාහා නැගිටවනු ලැබීමය.
මේ කුඩා පොත යේසුස් වහන්සේ කවීද, ඔහුගේ පසුබිම, ඔහුගේ ජීවිතය හා මරණය, ඔහුගේ දැන් ක්‍රියාකලාපය, අනාගත ක්‍රියාකලාපය පිළිබඳ හඳුන්වාදීමක් ඉදිරිපත් කරයි.

## අප යේසුස් වහන්සේ පිළිබඳ දැනගන්නේ කෙසේද ?

ක්‍රිස්තියානි ආගමේ ශුද්ධ වූ ග්‍රන්ථය බයිලබයයි කියනු ලැබේ. බයිබලයේ ප්‍රධාන කාණ්ඩ දෙකක් ඇත. පැරණි ගිවිසුම (හෙබ්‍රෙව් ශුද්ධ ලියවිලි කියාද කියති) යුදෙව්වන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථයයි. එය විශ්වය මැවීමේ සිට යේසුස් වහන්සේගේ කාලය දක්වා දෙවියන් වහන්සේ මිනිස් වර්ගයා සමඟ කටයුතු කළ ඉතිහාසය ආවරණය කරයි. නව ගිවිසුම් වනාහි යේසුස්

වහන්සේගේ හා ක්‍රිස්තියානි සභාවේ ආරම්භය පිළිබඳ කථාවයි.

බයිබලය වනාහි මිනිස් වර්ගයාට දෙවියන් වහන්සේගේ පණිවිඩයයි. එය අපට කියන්නේ විශ්වයේ එකම දෙවිකෙනෙක් ඇති බවත් ඔහු සියල්ල මැවූ බවත්ය. ඔහු මෙන්ම එළිදරව් වූ පුද්ගලයන් විසින් ඔහු ගැන දැනගත් දේ ලියූහ. පැරණි හා නව ගිවිසුම් දෙකෙහි විවිධ කතුවරුන් විසින් රචිත පොත් බොහෝ ගණනාවක් ඇත. මේ කතුවරුන් දෙවියන් වහන්සේ විසින් මෙහෙයවන ලදි. ඒ වනාහි ඔවුන් ලිවිය යුතු දේ දෙවියන් වහන්සේ ඔවුනට එළිදරව් කිරීමය. මේ නිසා නිතරම බයිබලය දේව වචනයයැයි කියනු ලබන්නේ එය මිනිස් කතුවරුන්ගේ අදහස් නොව දෙවියන් වහන්සේගේ එළිදරව් කිරීම් බැවිනි.

පැරණි ගිවිසුම යේසුස් වහන්සේගේ ක්‍රියාදාමය සඳහා පසුබිම සකසයි. එහි මෙසියස් වහන්සේ යැයි කියා යේසුස් වහනසේ පිළිබඳ බොහෝ අනාවැකි (පූර්ව කථනයන්) බොහෝ ඇතුලත්ව ඇත. ක්‍රිස්තුස් හා මෙසියස් යන වචන සමාන අර්ථයක් ගෙන දෙයි "රජු වශයෙන් අභිෂේක ලත් තැනැත්තා" යන්නය. නව ගිවිසුම එළිදරව් කරනුයේ පැරණි ගිවිසුමේ කලින් කියන ලද මෙසියස් වහන්සේ යේසුස් වහන්සේ බවය. නිතරම ඔහු යේසුස් ක්‍රිස්තුස් වහන්සේ හෝ සමහර විට ක්‍රිස්තුස් වහන්සේ යනුවෙන් සඳහන් කරනුයේ ඒ නිසාවෙනි.

## <u>පොරොන්දු වූ පුත්‍රයා</u>

බයිබලයේ පළමු වචන වලින් අපට කියන්නේ "පටන් ගැනීමේ දී දෙවියන් වහන්සේ අහසද, පොළොවද මැවූ සේක."
(උත්පත්ති 1:1)

ඉන්පසු දෙවියන් වහන්සේ සියළු ආකාර ජීවිතය මවන ලදි. අන්තිමේ දී ඔහු මිනිසෙක් හා ගැහැණියක් ආදම් ඒව මැවූ සේක. ඔහු මේ ප්‍රථම මිනිසාට හා ගැහැණියට සියල්ල දී අකීකරු උවහොත් ඔවුන් මිය යන බව කිය.

මේ දෙයට ආදම් සහ ඒව අකීකරු වූහ. දෙවියන්ට අකීකරු කම පාපය යිය කියනු ලැබේ. මිනිසාගේ හා ස්ත්‍රියගේ පාපය හේතුවෙන් ඔවුහු මරණයට පත්වූහ. කෙසේ හෝ දෙවියන් වහන්සේ ඔවුනට පොරොන්දුවක් කල සේක. ඔහු ඔවුන්ට කීවේ ස්ත්‍රියගෙන් පැවතෙන්නන්ගේ කෙනෙක් පාපය සහ මරණය පිළිබඳ ප්‍රශ්ණය විසඳන බවය.

දෙවියන් වහන්සේ ආදම් හා ඒව වහාම මරණයට පත් නොකළ සේක. එහෙත් ඔවුහු එහි ඵලයක් වශයෙන් මරණීය වූහ. ඔවුහු දරුවන් ලැබූහ. සියළුම මිනිස් වර්ගයා ඔවුන්ගෙන් පැවතෙන්නන්ය. ඔවුන්ගෙන් පැවතෙන සියල්ලන් වරදට බරවීම උරුම විය. අප පාපයට බර වූ චරිත ඇති දුබලයන් විය. ආදම් හා ඒව ගෙන් සියල්ලන් මේ නිසා මරණීය වූ අතර විනාශ වීමට නියම විය.

බලාපොරොත්තු රහිත පරම්පරා බොහෝ ගණනකට පසුව ඒබ්‍රහම් නම් විශ්වාස වන්ත මිනිසෙකු ඇතිවිය" දෙවියන් වහන්සේ ඔහුගේ විශ්වාසවන්ත කම ගැන බොහෝ පැහැදී ඔහු සමඟ ගිවිසුමක් කලේය" මේ ගිවිසුමෙහි උදාර පොරොන්දු රැසක් ඇතුලත්ය"

1. දෙවියන් වහන්සේ මේ මිනිසා හා ඔහුගේ පැවතෙන්නන් විශේෂයෙන් වෙන්කර ඔවුන් සමඟ විශේෂයෙන් ක්‍රියා කිරීමට පොරොන්දු විය. ඒබ්‍රහම්ගෙන් පැවතෙන්නන් යුදෙව්වන් වූ අතර දෙවියන්වහන්සේ ඔවුන් තම සෙනඟ ලෙස තොරා ගත්හ.

2. ඔහු විශේෂ පුත්‍රයෙකු ඇතිවන බවත් ඔහු පාලකයෙකු වන බවත් පොරොන්දු විය.

3. ඒබ්‍රහම්ගේ සහ අනික් සියළු පැවතෙන්නන් සඳහා මේ එක් විශේෂිත පුත්‍රයා ඒබ්‍රහම් වාසය කල දේශය සදාකාලයටම උරුම කර දෙන්නට පොරොන්දු විය.
4. ඔහු ඒබ්‍රහම් මගින් මුළු ලොවටම ආශිර්වාද කිරීමට පොරොන්දු විය.

5. ඔහු ආබ්‍රහම්ට සහ ඔහුගෙන් පැවතෙන්නන් හට දෙවියන් වීමට සදාකාලයටම පොරොන්දු විය.

ඒබ්‍රහම්ට පොරොන්දු වූ විශේෂ පුත්‍රයා ඒව ට පොරොන්දු වූ විශේෂිත පුත්‍රයාම විය. මේ පුත්‍රයා මගින් මුළු මහත් ලෝකයම ආශිර්වාද ලබයි තවත් වැදගත් වන්නේ යම් කෙනෙක් සදාකාලයටම භූමිය උරුම කර ගන්නේ නම් ඔහු සදාකාලයටම ජිවත්විය යුතුය. මේ නිසා ඒබ්‍රහම්ට හා විශේෂ පුත්‍රයාට හා අන් අයටද සදාතන ජිවිතය පොරොන්දු විය. දෙවියන් වහන්සේ ආදම් හා ඒවට කියූලෙස මේ පුත්‍රයා පාපය හා මරණය නැමැති ප්‍රශ්න විසඳා පොරොන්දු සම්පූර්ණ කිරීමට ඇත. ඒබ්‍රහම්ගේ පුත් ඊසාක් ද, ඔහුගේ පුත්

යාකොබ්ද, විශ්වාසී මිනිසුන් වූ අතර දෙවියන් වහන්සේ ඔවුනටද, පොරොන්දු දෙන ලදි. යාකොබ්ට පුතුන් දොලොස්දෙනෙකු වූ අතර ඔහුට ඊශ්‍රායල් යැයිද, කියනු ලැබේ. ඊශ්‍රායල් ජාතිය යාකොබ් හා ඔහුගේ දරුවන්ගෙන් පැවතෙන්නෝය. මේ ජනයා සඳහා තවත් නමක් වන්නේ යුදෙව්වන් යන්නය. තවත් පරම්පරා වලට පසුව දෙවියන් වහන්සේට බොහෝ විශ්වාසී මිනිසෙක් විය. ඔහුගේ නම දාවිත්ය. දෙවියන් වහන්සේ ඔහු ඊශ්‍රායල් ජාතියට රජු බවට පත්කොට තවත් විශේෂ පොරොන්දු කිහිපයක් ඔහු සමඟ කෙලේය. දෙවියන් වහන්සේ ස්ත්‍රියට පොරොන්දු වූ විශේෂ පුත්‍රයා ඒබ්‍රහම්ගේ පුත්‍රයාද, දාවිත්ගෙන් පැවැත එන්නෙකු වන්නේ යැයි ද පොරොන්දු විය. ඔහු මේ පුත්‍රයා මහරජු කෙනෙක් වන බවද, ඔහු සදාකාලයටම ඊශ්‍රායල් ජනයා පාලනය කරන බවටද, පොරොන්දු විය. දෙවියන් වහන්සේ තම සෙනඟට රජු වීමට කල්තියා නියම කරගත් තැනැත්තා ඒ සඳහා හිස තෙල් ගල්වා ආලේප කිරීම ක්‍රමය විය. ඒ නිසා පොරොන්දු වූ රජු "අලේපිත" යනුවෙන් කියන ලද අතර මෙසායා හෝ ක්‍රිස්තුස් වශයෙන් ද කියනු ලැබිණි.

## පුත්‍රයා උපන්නේය

නව ගිවිසුම මේ වචන වලින් ආරම්භවේ.

ඒබ්‍රහම්ගේ පුතු වූ දාවිත්ගේ පුත්‍රයා වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පරම්පරාවේ පොතය (මතෙව් 1:1)

යේසුස් වහන්සේ පොරොන්දු පුත්‍රයාය. ඔහු දෙවියන් වහන්සේ විසින් ආලේපකොට කල්තියා නියමකර ගත් රජුය. පාපය සහ මරණය ජය ගන්නේ ඔහුය. ඔහු ලෝකයට ආශිර්වාදය ගෙනෙන්නේය.

යේසුස් වහන්සේ ඔහුගේ මව මගින් ඒබ්‍රහම්ගේ ද දාවිත්ගේ ද පුත්‍රයාය. ඇගේ නම මරියා විය. ඇය විවාහ වීමට පෙර, දේව දූතයෙක් (දිව්‍යමය පණිවිඩ කරුවෙක්) ඇය වෙත එවන ලදුව ඇය මෙසියස් වහන්සේ ගේ මව වීමට යන බව කියන ලදි. ඇය කන්‍යාවියක් බැවින් මෙය සිදුවන්නේ කෙසේ දැයි ඇය පුදුම වූවාය. දේවදූතයා ඇයට කීවේ දෙවියන් වහන්සේගේ බලය කරන කොට ගෙන ඇය පුතෙකු පිළිසිඳ ගැනීමට සලස්වන බවය" ඒ නිසා ඒ දරුවා දෙවියන් වහන්සේගේ පුත්‍රයාය. එසේම මරියාගේ පුත්‍රයාය. දේව දූතයා කීවේ ඔහුගේ නම යේසුස් වන බවය. එහි අදහස "ගැලවුම්කරුය" ඔහු ඔහුගේ සෙනඟ පාපයෙන් ගලවා ගනු ඇත. ඔහු පොරොන්දු වූ රජ වන්නේය.

සමහර ආගම් කියන්නේ ඔවුන්ගේ දෙවියන් මිනිසුන් සමඟ ලිංගිකව සම්බන්ද වන බවය. යේසුස් වහන්සේගේ උපත සම්බන්ධ කාරණය කෙසේවත් මේ ආකාරයට නොවේ. එකම සත්‍ය නම් දෙවියන් වහන්සේ "සියල්ලේ මැවුම් කරුය" මරියාගේ කුස තුළ ඔහුගේ පුත්‍රයා මැවීය. ඇත්තෙන්ම යේසුස් වහන්සේ මරියාගේ ද දෙවියන් වහන්සේගේද පුත්‍රයාය. මැවුම්කරු ඔහුගේ ප්‍රාතිහාර්ය බලයෙන් හාස්කමක් මගින් දරුවෙකු සකස් කළේය.

සුදුසු කාලයේ දරුවා දේවදූතයා කී ලෙස බිහි විය. දේව දූතයන් පිරිසක් මේ ප්‍රීති දායක අරංචිය ප්‍රකාශ කලේය. මෙය මිනිස් ඉතිහාසයේ මහත් වූ සිදුවීමක ආරම්භය විය. මේ යේසුස් නම් මිනිසා තුල ක්‍රියාත්මක වීමෙන් දෙවියන් වහන්සේ මිනිස් වර්ගයාට ගැලවීමේ මාර්ගයක් දුන් සේක.

මරියා යෝසප් නම් මිනිසෙකුට විවාහ ගිවිස සිටියාය. යෝසප් මරියා විවාහ කරගති. ඉන්පසුව ඔවුනට සාමාන්‍ය ලෙස උපන් දරුවන් සමඟ යේසුස්, හදාවඩා ගැණින. යෝසප් වඩුවෙක් වූ අතර යේසුස් ද ඒ ව්‍යාපාරය උගත්තේය. තවත් ඔහු තමන් කවුරුදැයි ඔහුගේ මවගෙන්ද හෙබ්‍රිව් ශුද්ධ වූ ලියවිලි වලින් ද උගත්තේය.

වයස අවුරුදු තිහේදී යේසුස් වහන්සේ ඔහුගේ මහත් ක්‍රියාවලිය ආරම්භ කලේය.

## යේසුස් වහන්සේ ගුරුවරයා

අප කියන ලද පරිදි යේයස් වහන්සේ ආලේපිතයා, මෙසියස් වහන්සේ විය. නමුත් ඔහු පුරාණ කාලයේ රජවරුන් මෙන් හිස තෙල් ගල්වා අලේපිත නොකරන ලදි" දෙවියන් වහන්සේ ස්වකීය බලයෙන් උන් වහන්සේ ආලේපිත කරන ලදහ." එය ශුද්ධආත්මය යනුවෙන් හදුන්වනු ලැබේ. යේසුස් වහන්සේට ස්වාභාවික බලයට වඩා ඉහළ බලයක් දෙන ලදි. අසනීප සුවකිරිමට හා කොරුන් ඇවිදීමටද ඔහු කල අනෙක් හාස්කම් මගින්ද ඔහු ඇත්තෙන්ම දෙවින් වහන්සේගේ පුත්‍රයා බව ඔප්පු විය.

යේසුස් වහන්සේ වසර තුන හමාරක් යුදෙව් මිනිසුන්ගේ නගරවල හා පිටිසර පලාත්වල උගන්වමින් ඇවිද ගත කලේය. බොහෝ ස්ත්‍රීන් හා පුරුෂයින් ඔහු අනුගමනය කළහ. සමහරු කුතුහලයෙන් වූ අතර සමහරු "ගෝලයින්" විය. බෝහෝ අනුගාමිකයන්ගෙන් උන්වහන්සේ සමඟ විශේෂයෙන් කටයුතු කිරීමට දොලොස් දෙනෙක් තෝරා ගන්නා ලදහ. ඔවුහු පසුව ක්‍රිස්තියානි සභාවෙහි පුරෝගාමීන් වූහ.

යේසුස් වහන්සේ උගැන්වීමට සඳහා යොදා ගත් ප්‍රධාන ක්‍රමය වූයේ උපමා ක්‍රමය. මේවා පාඩමක් සහිත කථා වස්තුවන් විය" බොහෝ විට ඒවා සාමාන්‍ය කටයුතු පදනම් වූ සාමාන්‍ය ජීවිතයේ දේවල්ය. උදාහරණ ලෙස ගොවිතැන හෝ මංගල්‍යයක් සූදානම් කිරීමය. මේ උගැන්වීම් ක්‍රමය සමහර අයට උන් වහන්සේ අනුගමනය කිරීම අත් හැරීමට හේතු විය. ඔහු අදහස්කලේ කුමක්දැයි තේරුම් ගැනීමට කරදර වීමට ඔවුන්ට අවශ්‍ය නොවිය. නමුත් බොහෝ දෙන ඔහුගේ පණිවිඩය සොයා ගැනීමට යොමුවූහ. ඔවුන්ට අවබෝධ නොවූ විට ඔවුහු යේසුස් වහන්සේ වෙත පැමිණ ඔහුගේ අදහස විමසූහ. ඔහු මේ ක්‍රමයෙන් එය විස්තර කළේය. සත්‍ය ශිෂ්‍යයා මේ ක්‍රමයෙන් විශේෂිතව හඳුනාගත හැකි විය.

යේසුස් වහන්සේගේ උගැන්වීම් බොහෝ අභියෝගශීලි විය ඔහුගේ අනුගාමිකයන්හට ඉතා ඉහළ සදාචාරාත්මක ප්‍රමිතියකින් ඇමතිය. උන්වහන්සේ එදා යුගයේ ආගමික නායකයන් තමන්ගේ සිරිත් විරිත් එකතු කර දේව වචනය විනාශ කළ බැවින් ඔවුන්ටද අභියෝගයක් විය. යේසුස් වහන්සේ පැහැදිලි කළේ සත්‍ය දෙවියන් වහන්සේට ඉතා වැදගත් බවයි. එකම සත්‍ය දෙවියන් වහන්සේ උදක් කියා සිටින්නේ, මිනිසුන් ඔහු තේරුම්ගත යුතුය. කීකරු විය යුතුය. ඔහු පෙන්වූ ලෙසට ඔහු වෙත පැමිණිය යුතුයි. දෙවියන් වහන්සේ සොයාගැනීමට මාර්ගය මිනිසාට එළිදරව් කර ඇත. උන්වහන්සේ පිළිගන්නේ ඔහුගේ මාර්ගයන් අනුගමනය කරන්නන් පමණි. යේසුස් වහන්සේ දර්ශනයක් නොව දෙවියන්ගේ වහන්සේගේ පණිවිඩය සෙනඟ වෙත ගෙනායේය. ඔහු අපට කීවේ අප මේ පණිවිඩය සැලකිය යුතු බවය.

යේසුස් වහන්සේගේ ඉගැන්වීම් මෙවැනි කුඩා පොතක ආවරණය කිරීමට ඉඩ මදිය. ඔහු ඉගැන්වූයේ කුමක්දැයි දැන ගැනීමට ඔබ නව ගිවිසුම කියවිය යුතුය. ඔබ එය කරන විට ඔබට දැනෙන්නේ ඔහුගේ උගැන්වීම් වසර 2000කට පෙර වූ සේම අභියෝගාත්මකව බල කර සිටින බවය.

ඔහු උගැන්වූ ප්‍රධාන උගන්වීම් කිහිපයක්

1. මැවුම්කාර එකම දෙවියන් වහන්සේ ඔහුගේ දරුවන්ට මෙන් අපට ආදරය කරයි. ඔහු ආපසු ඔහුට ආදරය කිරීමට අපට කථා කරයි. ඔහුට "පියාණෙනි" කීමට අපට ආරාධනා කරයි. ඔහු බොහෝ ඈත නොවී හෝ හඳුනාගත නොහැකි නොවේ. ඔහු බලාපොරොත්තු වන්නේ අප සැම කෙනෙක්ම ඔහු හඳුනාගැනීම හා ළඟ සම්බන්ධයක් තබා ගැනීමටය. (මතෙව් 5:45 යොහාන් 17:3 ක්‍රියා 14: 15-17 ක්‍රියා 17:23-31 බලන්න.)

2. දෙවියන් වහන්සේ සෙනඟට ඇති ආදරය පෙන්වීමක් වශයෙන් ඔහු අපටද එකිනෙකාට ආදරය කිරීමට කියයි. සමහර විට ඔබ "ස්වර්ණ! අණ" අසා ඇත. යේසුස් වහන්සේ කීවේ "අන් අය ඔබට කුමක් කරනවාට කැමතිද අන් අයටත් එසේම කරන්න." (මතෙව් 7:12) ඔහු මෙසේද කීය. "ඔබ ඔබට ආදරය කරන්නාසේ ඔබේ අසල්වැසියාට ද ආදරය කරන්න." (මතෙව් 22:39) ඔහු අපට අපේ සතුරන්ට පවා ආදරය කිරීමට කීය. (මතෙව් 5:44) ඕනෑම සත්‍ය ක්‍රිස්තියානියකුගේ ජීවිතය මේ කරුණු මත පදනම් විය යුතුය. (ගලාති 5:17) බලන්න.

3. දෙවියන් වහන්සේ හරිදේ කුමක්ද වැරදි දේ කුමක් ද යන් න අපට කියා ඇත. වැරදි කිරීම පාපයයි. එයට මරණයෙන් දඬුවම් කෙරේ. වැරදි වලට අයත් වන්නේ මිනී මැරීම, සොරකම, බොරුකීම, විවාහයෙන් පිටත ලිංගික සබඳතා, කිසිවෙකු රැවටීම හෝ හානි කිරීම, යුද්ධකිරීම, අන් අයට වඩා ඉහලින් බලය සෙවීම. නිවැරදිව හැසිරීම නම් අවංකකම, අන් අයට කාරුණික වීම ඇත්ත කීම හා වචනය ඉටුකිරීම, විශ්වාසවන්තභාවය සහිත විවාහය, දෙවියන් වහන්සේගේ පණිවිඩය අන් අය සමඟ බෙදා ගැනීම වේ. (එපීස 5:3-7, 1කොරින්ති 7: 9-11, ගලාති 5:19 20 බලන්න.)

4. මිනිසුන්ට තමන්ගේ ජීවිත ගත කළ සැටි සිහිකර විනිශ්චය කරන දිනයක් ඇත්තේය. යේසුස් වහන්සේ උගැන් වූ ජීවන ක්‍රමය ඉවත දැමූ අය සදාකාල මරණයෙන් දඬුවම් කරනු ලබති. යමෙක් යේසුස් වහන්සේට අයත් විශ්වාසීව ඔහු අනුගමනය කලෝද ඔවුහු හට සදාතන ජීවිතය දෙනු ලබති.(යොහාන් 5:28-29, 2 කොරන්ති 5:9-10 බලන්න.)

## පාපය සඳහා පූජාවක්

මිනිස් වර්ගයා මරණීය වැරද්දක් කර ඇත. අප පාපයට ලැදිය. අප මරණීය වේ. අපහට පාපය අතහැර නිවරදිව සිටීමට දෙවියන් වහන්සේ කියා ඇතත් අප දුබලය. අපට පවිත්‍රව සිටිය නොහැක. දෙවියන් වහන්සේ ප්‍රකාශ කලේ "පාපයේ කුලිය මරණයයි" (6:20) එනිසා අප විනාශයට නියමව ඇත. අපට මේ තත්වයෙන් මිදීමට අවශ්‍යව ඇති අතර ජීවිතය පිළිබඳව බලාපොරොත්තුවත් අවශ්‍යය.

දෙවියන් වහන්සේ බොහෝ යුක්තිය සහගතය. කරුණාවන්තකමද බොහෝය. යේසුස් වහන්සේ මගින් අපට පාපයෙන් හා මරණයෙන් ගැලවීමට මගක් දී ඇත.

අප මෙන් නොව යේසුස් වහන්සේ කිසිදින පව් නොකලේය. ඔහු ද අප මෙන් පාපයට පරීක්ෂා කරනු ලැබිය. දේව පුත්‍රයා වශයෙන් ඔහුට හදිසි ආවේග මගින් පාපයට පත් නොවීමට ශක්තිය තිබිණ. යේසුස් වහන්සේ පැහැදිලිවම ධර්මපාධ විය. (පව් නොකොට) නමුත් ඔහුද අප මෙන් මිනිසෙකු විය. ඔහු තුල සැම විටම පව්කල හැකි ආවේගයන් විය. මේ පාපයට බර වූ ආවේගයන් සමහර විට "යක්ෂයා" යයි කියති. යේසුස් වහන්සේට අපමෙන් මරණයට පත් විය හැකි විය.

පැරණි ගිවිසුමේ දෙවියන් වහන්සේ එළිදරව් කලේ ලේ වැගිරවීමෙන් තොරව පව් සමාව දිය නොහැකි බවයි. මේ කරුණ මුල් කරගෙන සතුන් දෙවියන්ට බිලි පූජා වශයෙන් පුදකරන ලදි. පූජා කරන ලද පූජාතුලින් අප මිය යා යුතු බැව් වටහා ගන්නා ලද අතර එයින් අපගේ මරණය සහ දෙවියන් වහන්සේගේ උපේක්ෂාව පෙන්විය. දෙවියන් වහන්සේගේ කාරුණිකව මේ පූජාතුලින් අපගේ පාපය ඉවත් කරන අතර, ඉන් පසුව අප ධර්මිෂ්ඨව සලකන බවත්ය.

සත්වයෙකුගේ ලේ වැගිරීමෙන් ඇත්තෙන්ම මිනියාගේ පාපය දුරුකල නොහැක. නමුත් සර්වසම්පූර්ණ මිනිසෙකුගේ පූජාවෙන් යේසුස් වහන්සේට හැකිවිය. එය දෙවියන් වහන්සේගේ වැඩපිළිවෙලේ කොටසක් වූයේ යේසුස් වහන්සේ වන ඔහුගේ පුත්‍රයා පිරිසිදු පූජාවක් වශයෙන් පාපය වෙනුවෙන් පූජා කිරීමෙහි සතුන් පූජා කිරීමේ ක්‍රමය ජේසුස්ට පෙර දසුනක් වූ හෙයිනි.

යේසුස් වහන්සේ එක් ශිෂ්‍යයෙකු විසින් පාවා දෙනු ලැබිණ. යුදෙව් ආගමික නායකයන් විසින් මරණයට පත් කරනු ලැබිණ. ඔවුහු උන් වහනසේට ඊර්ෂ්‍යා කලහ. ඔහු දෙවියන් වහන්සේගේ වැඩ සටහනෙහි කොටසක් ක්‍රියාත්මක කල බව තේරුම් නොගත්තෝය. නායකයෝ යේසුස් වහන්සේ කුරුසියේ අණ ගැසීමට රෝමානු ආණ්ඩුකාරයාගෙන් ඉල්ලූහ. මෙය සාමන්‍ය අපරාධවලට මරණයට පත්කරන ක්‍රමය විය. එක් දඬුවමක් වූයේ කණුවකට තබා ඇණ ගැසීමයි. යේසුස් වහන්සේට හරස් ලියක් තිබුණේද යන්න අප නොදනිමු. නමුත් ඔහු අත්පා වලින් කණුවකට ඇණ ගැසූ බව දනිමු. පසුව ඔහු මරණයට පත්වන තුරු පැය කිහිපයක් එල්ලා තබනු ලැබින.

බොහෝ දෙනෙකුට මෙම බියකරු මරණය තුළින් දෙවියන්

වහන්සේට මිනිසුන් ගලවා ගැනීමට යමක් කල හැක්කේ කෙසේද, දැයි වටහා ගැනීම අපහසුය. නව ගිවිසුම අපට කියන්නේ ස්ත්‍රීන් හා පුරුෂයින් යේසුස් වහන්සේගේ මරණය හා සහභාගී වන විට ඔහුගේ පූජාව අපේ පාපයන් පිරිසිදු කරන බවයි. අපට දෙවියන් වහන්සේගෙන් සමාව ලැබේ. ඔහු අප ධර්මිෂ්ඨ ලෙස ගණන් ගනු ලැබේ. යේසුස් වහන්සේගේ ධර්මිෂ්ඨකම සහ අපගේ උන්වහන්සේ තුළ ඇති විශ්වාසය තුලින් අප ද ධර්මිෂ්ඨ ලෙස ගණන් ගනු ලැබේ. උන් වහන්සේ සාමාන්‍ය ලෙස මළේ නම් මේ ගැලවීම ලබා ගත නොහැකි වනු ඇත. නමුත් යේසුස් වහන්සේ මරණයේ රැඳී සිටියේ නැත.

## නැවත නැගී සිටීම

"පාපයේ කුලිය මරණය" නම් (රෝම 6:23) ධර්මිෂ්ඨකමේ ඵලය ද මරණය වීමද නිවැරදි නැත. යේසුස් වහන්සේ මිය ගිය එක නිවරදිය. හේතුව ඔහු තුළ යක්ෂයෙක් (පාපයට හදිසි පෙළඹවීම) විය තවද ඔහු මරණීය ස්වභාවයෙන් විය. නමුත් ඔහු කිසිදින පව් කලේ නැත. එහෙයින් පව්කාරයෙකු මෙන් ඔහු විනාශ වන්නට හැරිය යුතු නැත. එනිසා දෙවියන් වහන්සේ ඔහු මරණයෙන් නැගිටවූ සේක. මෙය "නැවත නැගිටවීමයි" කියනු ලැබේ.

ඔහුගේ මරණයේදී පාපයට පොළඹවන යුලුගතිය සදාකාලයටම මිය ගියේය. ඔහු නැවත නැගිට වනු ලැබූ විට ඔහු නැවත පව් කිරීමට ආශා නොවීය. දැන් ඔහු අමරණීයය. ඔහුට නැවත කිසිදිනක මිය යා නොහැක.

යේසුස් වහන්සේගේ මරණයත් නැවත නැගිටීමත් මහත් ජයග්‍රහණයක් ගෙන දුනි. මිනිස් ඉතිහාසයේ පළමුවරට මරණය විනාශ විය.

යේසුස් වහන්සේගේ ජිවිතය පුරාම සියළුම පාප ඔහු විසින් ජය ගෙන තිබුණි. පාපයට පරික්ෂා කරනු ලැබීම මිය ගියේය. ඔහු සදහටම ජිවත් විය.

යේසුස් වහන්සේ දෙවියන් වහන්සෙගේ පුත්‍රයා බවට නැවත නැගිටීම මහත් සලකුණක් විය. එසේම උන් වහන්සේ උගැන්වූ දෙය සත්‍ය විය. එසේම අප සැමට එය බලාපොරොත්තුවේ පහන් කණුව විය. යේසුස් වහන්සේ පාපය හා මරණය ජය ගත්තේය. දෙවියන් වහන්සේගේ කරුණාව නිසා ඔහුගේ ජයග්‍රහණය අපගේ ජයග්‍රහණයක් විය.

දියේ (ගිලීමෙන්) බෞතිස්ම වී ක්‍රිස්තියානි වන පුද්ගලයෙකුට මෙය ආගමික පුදුසිරිතක් නොවේ. මෙය අප කථා කල දෙයට අපේ සම්බන්ධකමය.

1. බෞතිස්මය වනාහි වැළලීම හා නැවත නැගිටීම පිළිබඳ සංකේතයකි. අප උපමා සහිතව, මිය යාම වැළලීම හා නවතාවයකින් අළුත් ජීවිතයකට නැගිටීමට සමාන පියවරකි. අප තවමත් පාපයට නැඹුරු ආවේග ඇති මුත් අපි නිදසුන් වශයෙන් එය මරණයට පත් කලෙමු. අප තවත් මැරෙන සුලු නමුත් අප යේසුස් වහන්සේට සේවය සඳහා සැරසෙමු.

"මෙසේ අප ජීවිතයේ අළුත් බවකින් හැසිරිය යුතුය."
(රෝම 6:4)

2. බෞතිස්මවීමෙන් අප මරණයට පත්වන බව අප වටහා ගනිමු. අප නොවලහා කියන්නේ අපට ගැලවීම අවශ්‍ය බවය. පාපයෙන් හා මරණයෙන් මිදීමට ඇති එකම මග ලෙස අප වටහා ගන්නේ යේසුස් වහන්සේගේ පූජාව මගින් බවය. " අ ද හ න ' න ා වූ, බෞතිස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය." (මාර්ක් 16:16)

3. අපේ බෞතිස්මය දෙවියන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය හා උන්වහන්සේගේ ගැලවීමේ ත්‍යාගය පිළිබඳ විශ්වාසය වැඩි කෙරේ. දෙවියන් වහන්සේ කාරුණික ලෙස අපේ විශ්වාසය ධර්මිෂ්ඨකම ලෙස ගණන් ගැනීමට ඉඩ හරී. දියේ ගිලීමෙන් අපේ පාප සෝදා හරිනු පමණක් නොව අප දෙවියන් ඉදිරියේ පවිත්‍ර කිරීමක් ද වේ. "බෞතිස්මයෙන් ඔහු සමග වළලනු ලැබ............ ඔබේ සියලු වරදට සමාව ලැබ," (කොලොස්සි 2:12-13)

4. බෞතිස්මයේ ස්වරූපය අපේ විශ්වාසය පැහැදිලි කිරීමක් සේ දෙවියන් වහන්සේ අප මරණයෙන් ගලවනු ඇත.

යේසුස් වහන්සේ මෙන් අපද සදාතන ජීවිත සඳහා නගා සිටවනු ඇත.
"උන්වහන්සේගේ මරණයේ සමානත්වයෙන් අප උන්වහන්සේට සම්බන්ධව සිටිමු නම් උන්වහන්සේගේ නැගිටවීමේ සමානතාවයෙනුත් අප සම්බන්ධවමු."
(රෝම 6:5)

# දෙවියන් වහන්සේ හා මිනිසා අතර අතරමැදියා

යේසුස් වහන්සේ මලවුන්ගෙන් නැගිටවනු පසු ඔහුගේ ශිෂ්‍යයන් සමඟ සති 6ක් පමණ කාලය ගෙවිය. ඔහු තමන් වහන්සේගේ සියල්ලන්හට නොපෙන්වූ සේක. නමුත් තමන් වහන්සේ සාක්ෂිකරුවන් සේ තෝරා ගත් අයට පමණක් පෙනුනි. උදාහරණයක් වශයෙන් වරක් පන්සියකට පමණ මහත් එක් පිරිසක් ඔහු ජීවත්ව සිටිනු දුටුවෝය.

යේසුස් වහන්සේ ඔහුගේ ශිෂ්‍යයන් හට ඉගැන්වූයේ ඔවුනු ගැලවීමේ සුභාරංචිය දේශනා කිරීමේ කටයුතු ඉදිරියට ගෙන යාම අවශ්‍ය බවය. ඔහු ඔවුනට ශුද්ධාත්මය ලැබෙන බව කීවේය. (එය දෙවියන් වහන්සේගේ බලය වේ.) ඇත්තෙන්ම ඔවුනු දෙවියන් වහන්සේගේ පණිවිඩය ලෝකයට ගෙන යන බවට සාක්ෂි වශයෙනි.

යේසුස් වහන්සේගේ ශිෂ්‍යයන් බලාසිටියේදී උන් වහන්සේ ස්වර්ගයට ඔසවනු ලැබීය. යේසුස් වහන්සේ දැන් ඔහුගේ පියා සමඟය. ස්වර්ගයේ දෙවියන් සමඟය. ඔහු තම අනුගාමිකයන්ට ගුරුවරයාගේ චරිතය දුන්නේය. දැන් ඔහුගේ ක්‍රියාවලිය අපේ පූජකයා වශයෙනි.

මිනිස් වර්ගයා හා දෙවියන් වහන්සේ අතර මැදිහත් කරුවකු පූජකයෙකුගේ රාජකාරිය වන්නේ දෙවියන් වැඳීමට එන අයගේ පුද පූජා ඔවුන් ඔවුන් වෙනුවෙන් දෙවියන්ට ඔප්පුකිරීමය. පැරණි ගිවිසුම කාලයේ සතුන් බිලි පූජාකල පූජකවරු වූහ. ඒ පූජාවල් අනාගතයේ මහත් වූ එක් පූජාවකට අරමුණු වූ බව අපි දනිමු. එසේම පූජක වරු එක් මහත් පූජකයෙකු, ඉදිරියේදී ඇතිවීම පෙන්නුම් කළහ. ඒ යේසුස් ක්‍රිස්තුස් වහන්සේය.

අද යේසුස් වහන්සේ අපේ මැදිහත්කරු, අප වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරියේ පෙනී සිටී. අපේ පාපය අපේ මැරෙන සුළු බව අප දෙවියන්ගෙන් ඈත් කරවයි. යේසුස් වහන්සේගේ දැන් කටයුත්ත අප නැවත දෙවියන් වෙත ගෙන යාමය. දෙවියන් වහන්සේ අපට ආදරය නිසා යේසුස් වහන්සේ සම්පූර්ණ මැදිහත්කරු නිසා දෙවියන් වහන්සේ විසින් අප පිළිගනු ලබයි. යේසුස් වහන්සේ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම නිසාම අප නියෝජනය කර ගැලවීම ලබාදීමට ඉඩදේ. ඒ නිසා අපට ගැලවීම ලැබිය හැක.

"ඇත්තේ එක දෙවිකෙනෙක් හා දෙවියන් වහන්සේටත් මිනිසාත් අතරේ එක මැදිහත් කරු කෙනකුත්ය. ඒ යේසුස් වහන්සේය" (තිමෝති 2:5)

# ක්‍රිස්තියානියේ ව්‍යාප්තිය

යේසුස් වහන්සේ පියා වෙතට ඔසවාගනු ලැබූ පසු ශිෂ්‍යයන් සුභාරංචිය පැතිරවීමට ලත් අනට කිකරු වූහ. පුරෝගාමී ශිෂ්‍යයන් "අපෝස්තුලු වරු" යයි කියනු ලැබූහ. එහි අදහස වූයේ විශිෂ්ඨ කටයුත්තකට යැවූ මිනිසුන් යන අර්ථයයි. එය යේසුස් වහන්සේ විසින් විශේෂයෙන් ඔහුගේ කාර්ය සඳහා යැවූවන් විය.

ඔහුගේ මරණයට පෙර යේසුස් වහන්සේ කිසිදිනක ඊශ්‍රායල් ජාතිය හැර නොගියේය. නමුත් දෙවියන් වහන්සේගේ දැඩි බලාපොරොත්තුව වූයේ යුදෙව්වරුනට පමණක් ගැලවීම නොවේ. දෙවියන් වහන්සේ යුදෙව් ජාතිය මගින් ක්‍රියත්මක කිරීමට හේතුව වූයේ ඒබ්‍රහම් ඉමහත් විශ්වාසී මිනිසෙක් වීම නිසාය. නමුත් ගැලවීම යේසුස් වහන්සේ තුලින් ඔහු වෙත එන සියල්ලන්ටය.

අපෝස්තුලුවරු යේසුස් වහන්සේ තුල ගැලවීමේ සුභාරංචිය දේශනා කරමින් රෝම අධිරාජ්‍යය පුරා ගියහ. හේතුව ඔවුනට ශුද්ධාත්ම බලය තිබිණ. ඔවුනට යේසුස් වහන්සේ කළා මෙන් හාස්කම් කිරීමට හැකියාව තිබිණ. මේ නිසා ඔවුහු නැවත නැගිටීම පිළිබඳව ඇසින් දුටු සාක්ෂිකරුවෝද වූහ. දෙවියන් වහන්සේ ඇත්තෙන්ම මිනිසුන් ගලවන බවට මෙය සාක්ෂි වශයෙන් මිනිසුන්ට කීවෝය.

විශාල සංඛ්‍යාවක් මිනිසුන් මෙම උගැන්වීමට ප්‍රතිචාර දුන්හ. ඔවුහු පණිවිඩය විශ්වාස කලා වූ තමන්ගේ පාපයන්ට සමාව ලබනු සඳහා බෞතිස්ම වූවෝය. මෙසේ ක්‍රිස්තියානිය එහි ආරම්භය පටන් ගති. ඉක්මනින්ම එහි සෑම තැනම ක්‍රිස්තියානි සභා ඇතිවිය. රෝමානු ආණ්ඩුව මේ අළුත් ආගමට කැමති නොවිය. ඔවුහු එය දේශපාලන රැවටිල්ලක් ලෙස දුටුවෝය. වහාම ක්‍රිස්තියානින්ට හිංසා කිරීම ඇරඹිණ. බොහෝදෙන මරණයට පත්කරනු ලැබූහ.

නමුත් සුභාරංචිය ව්‍යාප්ත වීම නොකඩවාම සිදුවිය. ඉදින් අපෝස්තලු වරයෙක්වහි වී නම් අළුත් විශ්වාසිනට යම් ශුද්ධාත්ම බලයක් දෙන ලදි. නමුත් අපෝස්තලුවරයෙක් හැර වෙනත් කිසිකෙනෙක් මේ බලය අන් අයට දීමට සමත් නොවිය. අපොස්තලුවරු එකිනෙකා මිය ගියේ ඔවුන්ගේ පණිවිඩයට විරෝධය දැක්වූවන් මගිනි. අන්තිමේදී ශුද්ධාත්ම බලය තිබූ සියල්ලෝම මිය ගියෝය. නමුත් අළුත් හා වඩාත් ස්ථිර වූ මාර්ගයකින් පණිවිඩය ඇත්තෙන්ම දෙවියන් වහන්සේගෙන් බව ඔප්පු කෙරින.

අපොස්තුලුවරු හා ආත්මික බලය තිබූ සමහර අයෙක් ද දේව අධික්ෂණයෙන් පණිවිඩය ලේඛන ගත කිරිම ඇරඹුනි. ඔවුහු යේසුස් වහන්සේගේ උගැන්වීම් හා ඔහුගේ ජිවිතයේ සිදුවීම් සටහන් කලෝය. ඔවුහු අපොස්තලුවරු කල දේද ලියුහ. ක්‍රිස්තියානි උගැන්වීම් ඇතුලත් ලිපි ඔවුහු ලිව්වෝය. මේ ලේඛණ නව ගිවිසුම වේ. හේබ්‍රව් ශුද්ධ ලියවිලි වන පැරණි ගිවිසුම මෙන් මේවාද දේව මෙහෙයවීම යටතේ ලියන ලද අතර ඇත්තෙන්ම දේව වචනයවේ.

"දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමත් තව දුරටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දිමටත් ප්‍රයෝජනවත් ව තිබේ." (2 තිමෝති 3:16)

අපොස්තුලුවරු මිය ගියහ. නමුත් ඔවුන්ගේ නව ගිවිසුමේ ලේඛණ වසර 2000 ක් තුල නාකඩවාම අපට උගන්වයි.

## යේසුස් වහන්සේ ආපසු එන්නේය.

යේසුස් වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලබන විට එහි බලා සිටි ගෝලයින්ට දේවදූතයන් කථාකර ඔවුන්ට කිවේ,

"නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවා ගනු ලැබූ මේ යේසුස් වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම ආපසු එන්නේය." (ක්‍රියා 1:9)

දෙවියන් වහන්සේ විසින් පොරොන්දු වූ දේ බොහෝ ප්‍රමාණයක් යේසුස් වහන්සේ විසින් කරන ලදි. ඔහු පාපය හා මරණය පරාජය කලේය. ඔහු සියල්ලන්ටම ආශිර්වාදය විය හැකි බලය විය. නමුත් ඔහු තවමත් රජුවිමට දුන් පොරොන්දුව සම්පූර්ණ කර නැත.

පැරණි හා නව ගිවිසුම් දෙකෙහිම බොහෝ අනාවැකි අපට කියන්නේ මෙසියස් වහන්සේ රජු වශයෙන් මහපොළොව පාලනය කරන්නේය යන්නයි.

යේසුස් වහන්සේ ඉක්මණින්ම මෙය කරනු ඇතැයි අපෝස්තුලුවරු බලාපොරොත්තු වුවද, ඔහු ඔවුන්ට කිවේ එය පසුව වන බවයි. (ක්‍රියා 1:6-7 බලන්න)

අපෝස්තුලු වරු දේශනාකලේ ඉතිරි පොරොන්දු සම්පූර්ණ කිරිමට යේසුස් වහන්සේ ආපසු එන්නේය. යන්නය. බයිබලය අපට කියන්නේ ඔහු

ආපසු එනවිට ඔහු කටයුතු කිහිපයක් කරන්නේය යනුවෙනි.

1. ඔහු දැනටමත් මිය ගිය එවුන් නැගිටවීමට දේව දූතයන් යවයි. ඔහු ඔවුන් හා දැනටමත් ජීවත්ව සිටින ඔහුගේ අනුගාමිකයන් එකට එකතු කරයි. (මතෙව් 24:31)

(තෙසලොනික 4:16 බලන්න)

2. එකතු කරනු ලබන සියල්ලන් විනිශ්චය කරනු ලබන්නේය. යේසුස් වහන්සේට විශ්වාසිව හා කීකරුව සිටිය වුන් සිසතින් නිශ්චය කරගනී. එසේ නොවුවන්ද නිශ්චය කරගනී. විශ්වාසින්ට සදාකාල ජීවිතය පරිත්‍යාග කරනු ලබයි. අවිශ්වාසිකයන් සදාකාල මරණයට තින්දුකරනු ලබයි. (යොහාන් 5:28-29, 2 තෙසලෝනික 1:9 බලන්න)

3. යේසුස් වහන්සේ එකම සත්‍ය දෙවියන් වහන්සේ වෙනුවෙන් සම්පූර්ණ ලෝකය පාලනය කරනු ලබයි. සියල්ලන්ම ඔහු පිළිගන්නේ නැත. යමෙක් විරුද්ධ වන්නේද ඔවුහු යටත් කරනු ලබයි. සියළුම පොලොව දෙවියන් වහන්සේ පිළිබඳ දැනුමකින් ද උන් වහන්සේගේ මහිමයෙන්ද පිරියන්නේය. (දානියෙල් 7:14 එළිදරව් 5:10 බලන්න.)

4. රජු වශයෙන් යේසුස් වහන්සේ සම්පූර්ණ යුක්තියෙන් පාලන කරයි. ඔහුගේ රාජ්‍යයේ කිසිත් දූෂණයක් නොවන්නේය. එහි විනාශයක් හෝ වේදනාවක්, යුද්ධයක්, රෝගයක් නොවේ. මරණය අභාවයට ගොස් මුළුමනින්ම නැතිව යයි. පාපය සහමුලින්ම නැතිවන තුරු රාජ්‍යය පවතින්නේය. අන්තිමේදී මරණය නැතිව යන්නේය. මේ කාලය වන විට එකද අවිශ්වාසි අයකු ඉතිරි නොවේ. එවිට යේසුස් වහන්සේ තම පියාට රජ්‍යය භාර දෙන්නේය. (1 කොරින්ති 15:24-28 එළිදරව්21: 1-8 බලන්න.)

යේසුස් වහන්සේ ආපසු එන්නේ කවදාදැයි අපි නියත වශයෙන් නොදනිමු. (මාර්ක් 13:32 බලන්න.) නමුත් යේසුස් වහන්සේ අපට උගැන්වූයේ ඕනෑම වෙලාවක ලෙසය.

පමාවීමට ප්‍රථම යේසුස් වහන්සේ උන් වහන්සේගේ පැමිණීම පිළිබඳ මූලික සලකුණු කිහිපයක් අපට දී ඇත. මේ සලකුණු වලින් බොහොමයක් අද සිදුවන බව අපට දැකිය හැක. එයින් එකක් වන්නේ යුදෙව් ජනයා ආපසු ඊශ්‍රායලයට පැමිණීමය. මේ සලකුණු ගැන බලන ක්‍රිස්තියානිහු

බොහෝ කලබල වන්නේ යේසුස් වහන්සේගේ පැමිණීමේ කාලය ඉතා ඉක්මණින් විය හැකි බැවිනි. සදාතන ජීවිතය පිළිබඳ පොරොන්දුව වේදනා වලින් තොර ලස්සන ලෝකය සාමය සහ යුක්තිය ඇති රාජ්‍යය ඇති වීමට ඉතා ලඟ බව පෙනේ.

යේසුස් වහන්සේ ඔබට ඔහුගේ ශිෂ්‍යයෙකු වීමට කැඳවයි. ඔබ පවුකාරයකු නිසා ඔබේ වරද නොසඟවා කීමට ඉල්ලන්නේ ඔබට ගැලවීම අවශ්‍ය නිසාය. ඔහු ඉල්ලන්නේ උන්වහන්සේට ඇහුන්කම්දී  එකම සත්‍ය දෙවියන් වහන්සේ තේරුම් ගැනීමටය. තවද ජීවිතය ලබා දෙන එකම මඟ අවබෝධයටය. ඔහු ඔබට කියන්නේ ඔබ ජීවත් වූ ජීවිතය අත්හැර ඔහුට කීකරු වීමටය. ඔහු ඔබට සදාකාල ජීවන ය පිළිබඳ බලාපොරොත්තුව දෙන අතර සදාකාල මරණය නැතිකිරීමට අවවාද කරයි.

ඔබට බයිබලය කියවීමෙන් යේසුස් වහන්සේ ගැන වඩවඩාත් ජීවිතය පිළිබඳ බලාපොරොත්තුව ගැනද වඩාත් උගත හැකිය.

ක්‍රිස්ටඩෙල්පියන්වරු (නමෙහි අදහස යේසුස් වහන්සේ තුළ සොයුරු සොයුරියෝ) මේ පොත ප්‍රසිද්ධ කරන්නේ ඔබට උපකාර කිරීමටය. ඔබට ප්‍රශ්න ඇති බව දෙවියන් දන්නා සේක. උන් වහන්සේ පිළිතුරු සපයා දෙනු ඇත. ඒ උන්වහන්සේගේ වචනයෙන්ද දැනටමත් යේසුස් වහන්සේ වෙත පැමිණි අය මගින් ද වේ.

යේසුස් වහන්සේ ඔහුගේ ශිෂ්‍යයන්ට කීවේ

"මම මාර්ගයද සත්‍යයද ජීවනයද වෙමි."
යොහාන් 14:6)
ඔබ වැඩියෙන් උගෙන ගත් විට ඔහු විශ්වාස කිරීමට හොඳ කරුණු ඇති බව ඔබට වැටහෙනු ඇත.

පෝල් ඩිල්මර්